# පාසැලෙන් ලැබෙන ගොවිතැන් දැනුම

ගොවිතැනට සිය ජීවිතයේ යම් සබැඳිතාවයක් ඇතිකරගන්නට උත්සාහ කරන තරුණ පෙලට, සිය ජීවන මගේ ආරම්භයේදීම ඒ පිළිබඳව දැනුමක් හා අත්දැකීමක් ලබාදීම අවශ්‍යවෙයි. මෙම මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා මෙරටේ සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. මේ පාසැල් හා එයට අදළ අංශවල කෘෂිකර්ම අධ්‍යාපනය පිළිබඳ විමසුමකි.

අප ආර්ථිකය මූලිකව කෘෂිකාර්මික වේ. වැඩ කරන ජනතාවෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් කෘෂිකර්මය රැකියාව කොට ගනිති. මෙම ශත වර්ෂය අවසානයේදී වුවද අප රට ආර්ථිකයෙහි කෘෂිකර්මය මුල්ම තැනට ගැනෙන නොහොත් ප්‍රධාන තැනකට ගැනෙන අංශයක් ලෙස පවතිනු ඇත. එම නිසා කෘෂිකර්ම අධ්‍යාපනයට විශේෂ තැනක් අනිවාර්යයෙන් ම හිමි විය යුතුය. දැනට කෘෂිකර්මයෙහි ලා විධිමත් පුහුණු විවිධ දැනුණු ආයතන රාශියක් මගින් සැපයේ. ඊට අමතරව කෘෂිකර්ම පුහුණුව පාඨශාලා අධ්‍යාපනයෙන් බාහිරව වැඩිහිටියන් වෙතින් හෝ අනෙක් ගොවියන් වෙතින් හෝ ලැබෙන ව්‍යවහාර ආශ්‍රයෙන් ලබා ගනී.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර ස්වභාෂා පාසල් කීපයක වතු වැඩ ග්‍රාමීය අධ්‍යාපන වැඩ සටහන් ආදී වශයෙන් ප්‍රායෝගික කෘෂිකර්මයට නැඹුරුවූ වැඩ සටහන් කීපයක් පවත්වා ගන යනු ලැබීය. පසුව ක්‍රම ක්‍රමයෙන් කෘෂිකර්ම අධ්‍යාපනය දියුණු විය. 1950 ස් ගණන් වලදී එය අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විෂයයක් විය. 1966 දී පළමුවරට කෘෂිකර්මය පාඨශාලා විෂය මාලාවෙහි අනිවාර්යය විෂයයක් කරන ලදී. ඊට අමතරව එවකට කුඹුරු වල්නෙළීම්, ගොයම පැල සිටුවීම්, පලතුරු ගස් සිටුවීම්, මී මැසි පාලන ආදී කෘෂිකර්ම වැඩ රාශියක් වැඩහුරුව යටතේ කරන ලදී. 1972 දී කෘෂිකර්මය, වතුබෝග, සුළු අපනයන බෝග, පළතුරු වගා, මල් වගා, සේද කර්මාන්තය, මී මැසි පාලනය, සත්ව පාලනය ආදිය ප්‍රාග්-වෘත්තීය විෂයයන් වශයෙන් පාසල්වල උගන්වන ලදී. 1978 විෂයමාලා ප්‍රතිසංස්කරණයේදි කෘෂිකර්මය හා ගෙවතු වගා තාක්ෂණික විෂය කාණ්ඩයට වැටුනි. අද අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ තාක්ෂණික විෂයයන් 12 අතුරින් ඉතාම ජනප්‍රියම විෂයය කෘෂිකර්මයයි. එසේම එය අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය හා විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයේ ද විෂයයක් වේ.

දැනට ලංකාවේ පාසල් 4,125 ක 6 වැනි ශ්‍රේණියේ සිට 10 වැනි ශ්‍රේණිය දක්වා කෘෂිකර්මය විෂයයක් වශයෙන් උගන්වනු ලැබේ. පාසල් 206 ක කෘෂිකර්ම ඒකක පිහිටුවා ඇත. මෙම ඒකකවලට කෘෂි විද්‍යාගාරයක්, ගබඩා කාමරයක්, කොටු කරපු ඉඩම් කොටසක් හා ජලසම්පාදන පහසුකම් ද ඇත. කෘෂිකර්මය උගැන්වීම සඳහා ද සෑහෙන ගුරුවරු සංඛ්‍යාවක් ඇත. උපාධිධාරීන් 40 ක් පමණ ද, කෘෂිකර්ම පුහුණු ගුරුවරු ,000 ක් පමණ ද, කෘෂිකර්ම ඩිප්ලෝමා ගුරුවරු 100 ක් පමණ ද, සහතික නොලත් ගුරුවරු 1,400 ක් පමණ ද සිටිති. මීට අමතරව ප්‍රායෝගික ගොවිකම් පාසල්වලින් පිටවූ 6 මස් පුහුණු ගුරුවරුද, වෛකල්පික විෂයයක් වශයෙන් ගුරු විද්‍යාලවල කෘෂිකර්මය හදාරපු ගුරුවරුද සමහර අවස්ථාවල කෘෂිකර්මය උගන්වනු ලැබේ.

1981 දී අ.පො.ස. (සා. පෙ.) විභාගයේ කෘෂිකර්මය විෂය සඳහා අයදුම් කරුවන් 69,512 ක් ද, ගෙවතු වගාව සඳහා අයදුම්කරුවන් 3,446 ක් ද පෙනී සිටින ලද අතර 1982 දී කෘෂිකර්මය සඳහා අයදුම්කරුවන් 1,09,913 ක් ද ගෙවතු වගාව

සඳහා අයදුම්කරුවන් 3,655 ක් ද පෙනී සිටින ලදී. මේ අනුව 1982 දී තාක්ෂණික විෂයයන් අතුරින් කෘෂිකර්මය සඳහා 37.3% ක් ද, ඊළඟ ජනප්‍රිය විෂය වූ ගෘහ ආර්ථික විද්‍යාව සඳහා 23.9% ක් ද පෙනී සිටි බව පහත දක්වෙන සංඛ්‍යා ලේඛනවලින් පෙනේ.

අධ්‍යාපන නිලධාරි
(කෘෂිකර්ම)
**යූ. ඇම්. අබේවර්ධන විසින්**

| විෂය | අයදුම්කරුවන් සංඛ්‍යාව | සංඛ්‍යාව මුළු සංඛ්‍යාවෙන් සියයට ගණන වශයෙන් |
|---|---|---|
| කෘෂිකර්මය | 1,09,913 | 37.3 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 70,486 | 23.9 |
| වානිජ්‍යය | 65,318 | 22.2 |
| මැහුම් වැඩ | 9.027 | 3.1 |
| ලී වැඩ | 9,560 | 3.2 |
| වියම | 6,380 | 2.2 |
| ගෙවතු වගා | 3,655 | 1.2 |
| ලඝුලේඛනය හා ටයිප් ගැසීම | 12.151 | 4.1 |
| ලෝහ වැඩ | 3,147 | 1.1 |
| මැටි වැඩ | 2,413 | 0 8 |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය | 1,169 | 0.4 |
| ගුවන් විදුලි ශිල්පය | 875 | 0 3 |
| ධීවර කර්මාන්තය | 174 | 0.2 |
| ජෛසජ්‍ය වැඩ | 160 | 0.2 |
| | 2,94,428 | |

1981 දී පිටවූ‍යා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා (ධවල පත්‍රිකා) වල කෘෂිකර්ම අධ්‍යාපනයට විශේෂ තැනක් හිමිවී තිබේ. කෘෂිකර්මය පෙරසේම තාක්ෂණික විෂයය. ගනයට ඇතුල් වේ. තවද තාක්ෂණික අධ්‍යාපන අධිකාරී යටතට වැටෙන අධ්‍යාපන පොදු සහතික පත්‍ර තාක්ෂණික ධාරාවටද කෘෂිකර්මය ඇතුළු වී තිබේ. දැනට සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය පිළිබඳව පිහිටුවා ඇති යූ. එන්. ඩී. පී - යුනෙස්කෝ ව්‍යාපෘතියේ ජීවන කුසලතා විෂය මාලාවටද (6 සහ 7 වන ශ්‍රේණි සඳහා) කෘෂිකර්ම අධ්‍යාපනයට සම්බන්ධ කුසලතා රාශියක් ඇතුළු වී තිබේ. නියාමයක පාසල්වල දැනට උගන්වනු ලබන බඳුන් ගත වගා, කුඩා ගෙවත්තක්, පුංචි ගෙවත්තට බීජ පැල ආදී ඉගැනුම් සිද්ධිවලට ඉහත කුසලතා ඇතුළු වී ඇත. රාජ්‍ය අංශයේ නොයෙක් ආයතන මගින් ක්‍රියාත්මක වන කෘෂිකර්ම අධ්‍යාපන පුහුණු කිරීමේ කටයුතු සමායෝජනය සඳහා කෘෂි අධ්‍යාපන මණ්ඩල පිහිටුවීමට ද අධ්‍යාපන ධවල පත්‍රිකාවේ යෝජනා කර ඇත,



මෙබඳු පරිසරයක වෙසන දරුවනට කෘෂිකාර්මික අධ්‍යාපනය අත්‍යාවශ්‍යයි.

පාසල් කෘෂිකර්ම අධ්‍යාපන වැඩ සටහන මගින් පාසල් සිසුනට නූතන විද්‍යාත්මක කෘෂිකාර්මික ශිල්පී ක්‍රම, ප්‍රායෝගික අත්දැකීම් හා හිතකර ආකල්ප ලබා දීම ප්‍රධාන අරමුණ වේ. එසේම අතර මගදී විධිමත් අධ්‍යාපනය නතර කරන සිසුනට පමණක් නොව විවේක කාලයේ වගා කටයුතුවල යෙදෙන කොයි කාටත් ප්‍රයෝජනවත් වේ. එසේම පාසල් සිසුන් මගින් නූතන තාක්ෂණික ශිල්පී ක්‍රම පාරම්පරිකව නොදියුණු ශිල්පී ක්‍රම අනුගමනය කරන ප්‍රජාවට ද බෙද හැරිය හැකි වේ.

පසුගිය ලිපියෙන් සම්පූර්ණ කෘෂිකර්ම අධ්‍යාපනය පිළිබඳව සාමාන්‍ය විස්තරයක් පළ කෙරිණි. එම ලිපියෙන් තාක්ෂණික විෂයයන් අතුරින් කෘෂිකර්මීය ඉතාමත් ජනප්‍රිය විෂයය බවත් අ.පො. ස. (සා.පෙ,) විභාගය සඳහා අයදුම්කරුවන් ලක්ෂයක් පමණ පෙනී සිටින බවත් පෙන්වා දෙන ලදී. මේ ලිපියෙන් සහ ඉදිරි ලිපි කීපයෙන් අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටින අයදුම් කරුවෙකු තමා මේ විෂයය හැදෑරීමට කැමැත්ත දක්වන කෙනෙකු විසින් ඉගෙන ගත යුතු දෑ (නිර්දේශ පත්‍රයට අනුකූලව) කුමක්දැයි සඳහන් කරනු ලැබේ. මෙය ප්‍රධාන කොටස් තුනකින් යුක්තය. එනම්, (i) මූලධර්ම, (ii) බෝග වගාව සහ (iii) තවාන් පාලනය ඇන්තූරියම් වගාව ඕකිඩ් වගාව, වී වගාව ගව පාලනය, කුකුළු පාලනය හා මී මැසි පාලනය ඇතුළු වෛකල්පිත කොටසයි.

## කෘෂිකර්ම මූලධර්ම

**පස**

ලංකාවේ ප්‍රධාන පස් වර්ග, එම පස්වර්ග වලට යෝග්‍ය බෝග පිළිබඳ කරුණු රැස්කිරීම පැලෑටියක වැඩීම කෙරෙහි පසෙහි ඇති වැදගත් කම අධ්‍යයනය කිරීම. සෝදා පාළුවෙන් පස ආරක්ෂා කිරීමේ ක්‍රම පසේ සාරවත් භාවය ආරක්ෂා කර ගැනීමට විවිධ උපක්‍රම යෙදීම හා එසේ කිරීමට හේතු. පසේ වැඩි ජලය ඉවත් කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම, වගාව බිම් වගාවනට යෙදවිය හැකි ක්‍රම සොයා බැලීම, පස සකස් කිරීම සඳහා යොදා ගන්න විවිධ උපකරණ, ඒවායේ රූප සටහන් ඇඳී කොටස් නම් කිරීම, එම උපකරණ වලින් කෙරෙන කාර්යයන් සටහන් කිරීම, ගොවීනැන් සඳහා යාන්ත්‍රික හා සත්ත්වබලයෙන් ක්‍රියා කරන උපකරණ යෙදීමෙන් සිදුවන වාසි හා අවාසි සටහන් කිරීම.

**දේශගුණය**

ලංකාවේ ප්‍රධාන ස්ථාන වල වාර්ෂික වර්ෂාපතනය පිළිබඳ කරුණු රැස්කිරීම. ලංකාවේ ප්‍රධාන ප්‍රදේශවල නිරිත දිග හා ඊසාන දිග මෝසම් සුළඟින් ලැබෙන වර්ෂාව පිළිබඳ කරුණු රැස්කිරීම, වර්ෂයේ ඒ ඒ මාසවල කිනම් මෝසම් සුළඟින් වර්ෂාව ලැබේදැයි සටහන් කිරීම, ප්‍රදේශයේ ප්‍රධාන වගාකන්න, බෝග වගා කල යුතු කාලය දැන ගැනීම.

**සිටුවන ද්‍රව්‍ය**

වගාව සඳහා ගන්නා බීජවල තිබිය යුතු ලක්ෂණ, බීජවල අක්‍රියතාව ඉවත කරන ක්‍රම අත්හදා බැලීම, වගා සඳහා බීජ රැස්කිරීම, ගබඩා කිරීම ප්‍රරෝහන ශක්තිය පරීක්ෂා කිරීම, සිටුවීමට ගන්න, වෙනත් ද්‍රව්‍ය, සිටුවීම සඳහා ඒවා සකස් කිරීම, බීජ අල ලබාගන්නා පෙක් රැක බලා ගැනීම, පැල බඳුන් ගත කිරීම.

**පොර**

වගාවන් සඳහා ප්‍රදේශයෙන් ලබාගත හැකි ඓන්ද්‍රීය පොර පිළිබඳ විස්තර රැස්කිරීම, අමු කොල පොර, ගවගාල් පොර, කොම්පෝස්ට් පොර යනාදිය සකස කිරීම හා පසට යෙදීම. ඓන්ද්‍රීය පොර යෙදීමෙන් සිදුවන යහපත සටහන් කිරීම.

ප්‍රදේශයේ බහුලව පාවිච්චි කරනු ලබන රසායනික පොර වර්ග හා ඒවා හඳුනා ගැනීමේ ලක්ෂණ, වෙළඳ පළේ මිල ගණන් සටහන් කිරීම, කිරීම, නයිට්‍රජන් පොස්පරස් හා පොටෑසියම් සපයනු ලබන ප්‍රධාන පොර වර්ග දැන ගැනීම. ඒ ඒ බෝගවලට නිර්දේශිත රසායනික පොර යෙදීම. බෝගවලට දක්නට ලැබෙන නයිට්‍රජන්, පොස්පරස හා පොටෑස් ඌණතා ලක්ෂණ හඳුනා ගැනීම සටහන් කර ගැනීම හා ඒවා මගහරවා ගැනීමට ප්‍රතිකාර කිරීම.

**වල් පැලෑටි**

බෝගවලට හානි පමුණුවන වල් පැලෑටි හඳුනා ගැනීම, ඒවායේ ප්‍රචාරණ ක්‍රම අධ්‍යයනය කිරීම, යාන්ත්‍රික හා ජෛව ක්‍රම වලින් වල් පැලෑටි මර්ධනය, රසායනික ද්‍රව්‍ය මගින් වල් පැලෑටි මර්දනය කිරීම, ඒ සඳහා යොදන මිශ්‍රණ සකස් කිරීම හා ඒ පිළිබඳව ප්‍රායෝගික දැනුමක් ලැබීම. ප්‍රදේශයේ වගාවනට හානි පමුණුවන වල් පැලෑටි වර්ග හඳුනා ගැනීම හා වල් පැලෑටි පොතක එම වල් පැලෑටි වෝවන අයුරු හා වැඩීමේ විලාශය පිළිබඳව කෙටි සටහන් ඇතුල් කිරීම.

### පළිබෝධ

බෝගවලට හානි කරන පළිබෝධක යන්ගේ ශරීර ලක්ෂණ හා හානියේ ස්වභාවය සටහන් කර ගැනීම, පළිබෝධ මර්ධන ක්‍රම යෙදීම, ප්‍රදේශයේ ප්‍රධාන වගා වලට වැඩි වශයෙන් හානි පමුණුවන කෘමීන්ගේ ජීවන චක්‍රය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

### රෝග

බෝගවලට හානිකරන රෝග දැන ගැනීම, එම රෝග පෙන්නුම් කරණ ලක්ෂණ සටහන් කිරීම හා රෝග මර්ධන ක්‍රම යෙදීම.

### ජල සම්පාදන ක්‍රම

වගාවනට ජලය සැපයීමේ ක්‍රම අත්හදා බැලීම, ප්‍රදේශයේ ජල සම්පාදන ක්‍රම අධ්‍යයනය කිරීම. වෙළඳපලට සකස් කිරීම අස්වැන්න හා ගබඩා කිරීම

අල බෝග, එළවළු බෝග, කුළු බඩු බෝග, ධාන්‍ය වර්ග. පළතුරු වර්ග හා මල් බෝග.
විවිධ ගොවිතැන් ක්‍රම අත්හදා බැලීම

බෝග මාරුව, සත්ව බෝග මාරුව, මිශ්‍ර බෝග ගොවිතැන, බහු බෝග වගාව.

වගා කටයුතු සඳහා ආධාරවන රජයේ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන

ඒ ඒ දෙපාර්තමේන්තු හා ආයතනවලින් ලබාගත හැකි පහසුකම්.

එළවළු වගාව, පළතුරු වර්ග වගා කිරීම සඳහා ණයක් ලබාගැනීමට සරල ඇස්තමේන්තුවක් සකස් කිරීම.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකර්මික යෝජනා ක්‍රම පිළිබඳව සරල දැනුමක් හා එම ගොවිතැන් වලින් රටට සැලසෙන ආර්ථික ප්‍රයෝජන.

පරිසර ආරක්ෂා කිරීමේ වැදගත්කම කෘෂිකර්ම කටයුතුවලට මෙහි ඇති සම්බන්ධතාවය.

